# ශ්‍රී ලංකාවේ මාර්ගගත පොදු ප්‍රවේශ සූචිවල (OPACs) සිංහල පුද්ගල නාම සාධිකාරී පාලනය

ආචාර්ය ප්‍රියංවදා වනිගසූරිය
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
priyanwada@kln.ac.lk

**සාරසංක්ෂේපය**

පුස්තකාල මූලාශ්‍රය පහසුවෙන් සොයාගැනීම හා කර්තෘන් හඳුනාගැනීම සඳහා පුද්ගල නාම බෙහෙවින් වැදගත් වේ. පුස්තකාල ස්වයංක්‍රීයකරණ පද්ධතිවල ජනප්‍රිය ම ගවේෂණ මාර්ගය වන්නේ පුද්ගල නාම යටතේ ගවේෂණය කිරීම බව පූර්ව පර්යේෂණවලින් අනාවරණය වී ඇත. එහෙත් පුද්ගල නාමවල ඇති විවිධතා සාර්ථක තොරතුරු සමුද්ධරණයට, සමාන තොරතුරු මූලාශ්‍රය සම්බන්ධීකරණයට සහ ප්‍රකාශන හිමිකම් කළමනාකරණයට අහිතකර ලෙස බලපායි. සිංහල පුද්ගල නාම භාවිතයේ දී වැරදි ලෙස අක්ෂර වින්‍යාස යොදාගැනීම, එක ම කර්තෘ නාමය ආකාර කිහිපයකින් භාවිතය සහ කර්තෘවරුන් දෙදෙනෙකුට එක ම නම පැවතීම නිසා එකී නාම භාවිතයන් පරිගණකයට හඳුනාගැනීමට නොහැකි ය. එවිට සිදුවන්නේ සංලේඛ පුද්ගලයන් දෙදෙනෙකු ලෙස හඳුනා ගැනීම යි. මෙම ගැටලුව විසඳීම සඳහා පුස්තකාලයවල ජාත්‍යන්තර ව පිළිගත් සාධිකාරී පාලන ගොනු පවත්වාගෙන යයි. ශ්‍රී ලංකාවේ විවිධ පුස්තකාල වර්ගවල නිසි ජාත්‍යන්තර සාධිකාරී ගොනු නොසලකා කර්තෘ නාම ආකෘති රටා අනුගමනය කරන බව හඳුනාගත හැකි ය. මෙම ව්‍යාකුලත්වය අවම කිරීම සඳහා සුදුසු සම්පූර්ණ ස්වයංක්‍රීය කර්තෘ නාම සාධිකාරී ගොනුවක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. මීට අමතර ව, සාධිකාරී පාලන කාර්යයන් සඳහා නිසි අක්ෂර පරිවර්තන ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු ය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ කෘතියක් එහි නිශ්චිත පෞද්ගලික නාමයෙන් හඳුනා ගැනීම සඳහා ස්වයංක්‍රීය සාධිකාරී ගොනුවක් සකස් කිරීම යි. මෙම අධ්‍යයනයේ දී නාම විචලනය හඳුනා ගැනීම සඳහා නියැදිය ලෙස ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හා මොරටුව විශ්වවිද්‍යාලයේ මාර්ගගත පොදු ප්‍රවේශ සූචිවල භාවිත ශීර්ෂ තේරීමට ඇතුළත් කළ කර්තෘන්ගේ නම් භාවිත කළ අතර ඒවා ලැයිස්තුගත කිරීම හා ස්වරූප හඳුනාගැනීමට සංඛ්‍යානමය ක්‍රමයක් භාවිත කර ඇත. එවැනි අවස්ථාවල කර්තෘ නාම සාධිකාරී පාලනය භාවිත කර තිබේ ද? යන්න පරීක්ෂා කිරීම සඳහා වෙබ් සමීක්ෂණ ක්‍රමය භාවිත කරමින් තෝරාගත් පුස්තකාලයවල මාර්ගගත පොදු ප්‍රවේශ සූචි පරීක්ෂා කරන ලදී. ඒ සඳහා පෙර නාම පරීක්ෂා කිරීම, අදාළ ශීර්ෂ නාමය සොයා තහවුරු කිරීම, ශීර්ෂ පද නිර්ණය කිරීම, ශීර්ෂයන්හි ස්වරූපය නිශ්චය කර ගැනීම සහ විවිධ නාම ස්වරූප යටතේ එක ම පුද්ගලයෙකු පෙනී සිටී දැයි පරීක්ෂා කිරීම සිදුකරන ලදි. අධ්‍යයනය මගින් හඳුනාගත් කර්තෘන්ගේ නම් සෙවීමේ දෝෂ අවම කිරීම සඳහා, පිළිගත් කතුවරුන්ගේ වඩාත් ප්‍රසිද්ධ නම් සඳහා සුදුසු නාම ආකෘති ස්වයංක්‍රීය ව හඳුනාගැනීම හා උද්ධරණය සඳහා ලැයිස්තුවක් සම්පාදනය කෙරිණි. එමගින් සාධිකාරී ගොනුවක් භාවිත කර සියලු ම පුස්තකාලයවල පහසුකම් සැලසීම මගින් රටක පුද්ගල නාමවල ඒකමිතියක් ඇති කළ හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** පුස්තකාල, මාර්ගගත පොදු ප්‍රවේශ සූචි, සාධිකාරී පාලනය, සිංහල කර්තෘ නාම, ශ්‍රී ලංකාව

# Authority Control of the Sinhala Personal Names in the Online Public Access Catalogues (OPACs) in Sri Lanka

Dr. Priyanwada Wanigasooriya
Senior Lecturer, Department of Library and Information Science, University of Kelaniya
priyanwada@kln.ac.lk

**Abstract**

Personal names play a crucial role in finding library sources and identifying authors. Previous research has revealed that the most popular search path in library automation systems is searching under personal names. However, variations in personal names adversely affect the quality of information retrieval, the linking of related resources, and copyright management. When using Sinhala personal names, misspellings of names, use of the same author's name in several forms, and the presence of the same name for two authors make it impossible for computers to recognise the use of such names. Consequently, those entries are retrieved as two separate individuals. To this, libraries employ internationally accepted authority control files. In Sri Lanka, it is evident that many libraries adhere to name formatting patterns without giving due consideration to proper international authority formats. Establishing a suitable fully automated author name authority file is essential to minimise this confusion. Additionally, adopting appropriate transliteration processes is essential for effective authority control functions. The primary objective of this study was to develop an automated authority file for the accurate identification of books by their respective authors' names. The names of authors recorded in the OPACs of the National Library of Sri Lanka and the University of Moratuwa were used as a sample to identify name variation, and a statistical method was used to list them and identify patterns. To ascertain the utilisation of author name authority control in such occasions, OPACs of selected libraries were examined using the web survey method. This process included examining previous names, confirming relevant name headings, determining access points, determining the form of headings, and verifying whether the same individual appeared under various name forms. The study compiled a list for automatic recognition and retrieval of appropriate name forms for the well-known names of recognised authors, to reduce errors in searching author names identified during the study. It enables uniformity of personal names in a country by facilitating all libraries using a single authority file.

**Keywords:** Authority Control, Libraries, Online Public Access Catalogues, Sinhala Authors Name, Sri Lanka